# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 269/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திக<br>Date | 14/02/2024<br>පැය 1730 | | |

## මාධ්‍ය නිවේදනය

**අධිමාත්‍රා මත්පෙති විකිණීම සම්බන්ධයෙන් වෛද්‍යවරයෙකු අත්අඩංගුවට - ඇත්ගාල පොලිස් ස්ථානය.**

2024.02.13 වන දින ඇත්ගාල පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ඇත්ගාල පොලිස් වසමේ ජයමාලපුර ප්‍රදේශයේදී අධිමාත්‍රා ඖෂධ මත්පෙති 1600 ක් විකිණීම සිදු කරන ලද වෛද්‍යවරයෙකු ඇත්ගාල පොලිසියේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගන්නා ලද සැකකරු වයස අවුරුදු 49 ක් වන ගෙලිඔය, කරමඩ ප්‍රදේශයේ පදිංචි වෛද්‍යවරයෙකි.

සැකකාර වෛද්‍යවරයා විසින් මත්ද්‍රව්‍ය භාවිතයට හුරුවූ පුද්ගලයින් මත්ද්‍රව්‍ය නොමැති අවස්ථා වලදී භාවිතයට ගනු ලබන ප්‍රිගැබලින් (Pregabalin) පෙති 1100 සහ ට්‍රැමඩෝල් (Tramadol) පෙති 500 ක් සමග අත්අඩංගුවට ගෙන ඇති අතර දීර්ඝ කලක සිට සිදු කරන ලද විමර්ශනයකට අනුව උපාය දූතයෙකු යොදවා මෙම වැටලීම සිදු කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු අද දින ගම්පොල ගරු මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2024.02.19 වන දින දක්වා රක්ශිත බන්ධනාගාර ගත කර ඇත.

ඇත්ගාල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**